# තනතුරු ඇබෑර්තු

## ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු

## රාජ්‍ය අමාත්‍යාංශය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## නිවාස පාලක(III ශ්‍රේණිය )/ පෙර පාසල් ගුරු(III ශ්‍රේණිය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිවාස පාලක තනතුරු 05ක්, පෙර පාසල් ගුරු තනතුරු 01ක්, සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට 2021.05.11 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ **"නිවාස පාලක( III ශ්‍රේණිය) / පෙර පාසල් ගුරු( III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම"**යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.www.socialservices.gov.lkවෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුරට බඳවා ගැනිම සඳහා වන සුදුසුකම්:-

### 1. නිවාස පාලක (පුරුෂ)

1.1 **වයස් සීමාව** :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

1.2. **අධ්‍යාපන සුදුසුකම්** :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

1.3. **වෘත්තීය සුදුසුකම්** :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් ළමා සංවර්ධනය පිළිබඳ හෝ සමාජවැඩ පිළිබඳ හෝ නේවාසිකාගාර පාලනය පිළිබඳ මාස තුනකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

1.4. **පළපුරුද්ද** :-

අදාළ නොවේ.

1.5. **කායික සුදුසුකම්** :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.6. **වෙනත්** :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 1.1 සිට 1.6 දක්වා වන සියළුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.7. **බඳවාගැනීමේ ක්‍රමය** :-

ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකෙන්ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

1.7.1 **ලිඛිත පරීක්ෂණය** :-

| | | | | |
|---|---|---|---|---|
| I. | බුද්ධි පරීක්ෂණය | - කාලය පැය 01, | මුළු ලකුණු 100, | සමත් ලකුණු 40% |
| II. | භාෂා හැකියාව | - කාලය පැය 01, | මුළු ලකුණු 100, | සමත් ලකුණු 40% |

1.8. **වැටුප් පරිමාණය** :-

රා.ප.ච. 03/2016 අනුව MN 01 -2016
වැටුප් පරිමාණය රු.27,140/- 10X300-11X350-10X495-10X660-45,540/- වේ.

1.9. **සේවා කොන්දේසි** :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය.රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

### 2. පෙර පාසල් ගුරු

2.1 **වයස් සීමාව** :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

**2.2අධ්‍යාපන සුදුසුකම්** :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

2.3. **වෘත්තීය සුදුසුකම්** :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ මාස තුනකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

**2.4. පළපුරුද්ද** :-

අදාළ නොවේ.

**2.5. කායික සුදුසුකම්** :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**2.6. වෙනත්** :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 2.1 සිට 2.6 දක්වා වන සියළුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2.7. බඳවාගැනීමේ ක්‍රමය** :-

ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකෙන්ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

2.7.1 **ලිඛිත පරීක්ෂණය** :-

| | | | | |
|---|---|---|---|---|
| III. | බුද්ධි පරීක්ෂණය | - කාලය පැය 01, | මුළු ලකුණු 100, | සමත් ලකුණු 40% |
| IV. | භාෂා හැකියාව | - කාලය පැය 01, | මුළු ලකුණු 100, | සමත් ලකුණු 40% |

**2.8. වැටුප් පරිමාණය** :-
රා.ප.ච. 03/2016 අනුව MN 01 -2016
වැටුප් පරිමාණය රු.27,140/- 10X300-11X350-10X495-10X660-45,540/- වේ.

**2.9. සේවා කොන්දේසි** :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය

යුතුය.රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

**සටහන**

- සමාජ සේවා අධ්‍යක්ෂක විසින් තීරණය කරනු ලබන ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ
- ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම් කරුවන් පමණක් ඉල්ලුම් කල යුතු අතර තෝරා ගත් අයදුම් කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

වන්දන රණවීර ආරච්චි
සමාජ සේවා අධ්‍යක්ෂ

**සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**2 වන මහළ**
**II වන අදියර**
**සෙත්සිරිපාය**
**බත්තරමුල්ල.**

**2021.04.**

Source: www.socialservices.gov.lk (2021.05.09)